ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ
***

# පුවත්පත් නිවේදනය

## <u>77වන ඉන්දීය නිදහස් දින සැමරුම</u>

77 වන ඉන්දීය නිදහස් දිනය මහත් උද්යෝගයකින් 2023 අගෝස්තු 15 වන දින ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන් හිදි සමරන ලදී. කොළඹ පැවති ප්‍රධාන උත්සවය ඉන්දියානු මහ කොමසාරිස්තුමාගේ නිල නිවස වන 'ඉන්දියා හවුස්' හිදි පැවැත්විණ. මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා ඉන්දීය ජාතික ධජය එසවීමෙන් අනතුරුව හමුදා උත්තමාචාර නිරීක්ෂණය කළේය. ඉන්දීය ජනාධිපතිතුමාගේ 77 වන ඉන්දීය නිදහස් දිනය පණිවිඩය ද එතුමා විසින් මෙහිදී ඉදිරිපත් කරන ලදී.

2. ඉන්දීය ප්‍රජාවේ සිය ගණනක් පිරිස මෙම අවස්ථාවට සහභාගී වූහ. මෙම විශේෂ අවස්ථාවේ දී මහ කොමසාරිස්තුමා පංචප්‍රාණ ප්‍රතිඥාව ද ඉදිරිපත් කළ අතර පැමිණ සිටි සැවොම ජාතිය ගොඩනැගීමට සහ වසර 2047 වන විට ඉන්දියාව සංවර්ධිත රටක් බවට පත් කිරීමට කැපවන බව සපථ කර සිටියහ.

3. සංස්කෘතිකාංග මෙම අවස්ථාව තවත් විචිත්‍රවත් කළ අතර ශ්‍රී ලංකා නාවික හමුදා තූර්ය වාදක කණ්ඩායම වීරත්වය සහ ජාත්‍යාලය සංකේතවත් කරන මිහිරි තනු වාදනය කළේය. ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ සිසු සිසුවියන් විසින් 'වෛෂ්ණව ජනතෝ' යන භජන් ගීතයට භරත නර්තනාංගයක් ද 'වන්දෙ මාතරම්' ගීතයට ඉන්දියානු සහ ශ්‍රී ලාංකික නර්තන ශෛලීන් දෙකම කැටිකරගත් නර්තනාංගයක් ද ඉදිරිපත් කරන ලදී.

4. මහ කොමසාරිස්තුමා සහ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීහු ශ්‍රී ලංකාවේ සාමය සහ එක්සත්භාවය ආරක්ෂා කිරීම උදෙසා දිවි පිදූ

ඉන්දීය සාම සාධක හමුදා විරුවන් වෙනුවෙන් ඉන්දීය සාම සාධක හමුදා ස්මාරකයේ දී සිය උපහාරය පුද කළහ.

5. මහනුවර සහකාර මහ කොමසාරිස් කාර්යාලය සහ යාපනය සහ හම්බන්තොට ඉන්දීය කොන්සියුලර් ජෙනරාල් කාර්යාල විසින් ද විශේෂ නිදහස් දින සැමරුම් සංවිධානය කර තිබිණ.

6. මෙම වසරේ නිදහස් දින සැමරුමත් සමඟ ප්‍රගතිශීලී සහ ස්වයං-විශ්වාසී ඉන්දියාවක 75 වන වසරක් සැමරීම සඳහා සංවිධානය කරන ලද ගෝලීය වැඩපිළිවෙළ වන 'අසාදි කා අම්රිත්' මහෝත්සවය කූට ප්‍රාප්තිය කරා ළඟා විය. ඉන්දියාව 'අම්රිත් කාල්' එනම් වසර 2047 වන විට ඉන්දියාව සංවර්ධිත රටක් බවට පත් කිරීම සඳහා පර්වර්තනීය වර්ධනයක් කරා යන විසි පස් වසරක ගමනකට එළඹ ඇත. ඉන්දීය ප්‍රජාව 'හර් ඝර් තිරංගා' වැඩසටහනට සහභාගී වෙමින් මෙන්ම වර්ධනය වන ඉන්දියාවක කතාන්දර සිහි කරමින් සහ 'මෙරි මාති මෙරා දේශ්' වැඩසටහන යටතේ මාතෘභූමියට උත්තමාචාර පුද කරමින් ඉන්දීය නිදහස් දිනය මහත් උනන්දුවකින් සැමරූහ.

****

කොළඹ
2023 අගෝස්තු 16

වීඩියෝ යොමුව : https://www.youtube.com/watch?v=NfW_QoSZgRE